## සංක්ෂිප්තය


පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (පූර්ණකාලීන) පාඨමාලාව ක්‍රියාත්මක කෙරෙන ආකාරය සම්බන්ධිත පාර්ශවයන්ගේ අත්දැකීම් ඇසුරින් හඳුනාගැනීම මෙම පර්යේෂණයේ මූලික පරමාර්ථය විය. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (පූර්ණකාලීන) පාඨමාලාවේ අරමුණු හා ගුරුශිෂ්‍ය අරමුණු අතර පවත්නා සබඳතාව හඳුනාගැනීම, පාඨමාලාවේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදුවන ආකාරය විමර්ශනය කිරීම, පාඨමාලාවට අදාළ ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුව ක්‍රියාත්මක කෙරෙන ආකාරය හඳුනාගැනීම, පාඨමාලාවට අදාළ නිබන්ධයේ අධ්‍යයන කටයුතු ක්‍රියාත්මක කෙරෙන ආකාරය හෙළිදරව් කරගැනීම, පාඨමාලාව ක්‍රියාත්මක කිරීමේ දී මුහුණදීමට සිදුවන අභියෝග හඳුනාගැනීම යන ප්‍රධාන අරමුණු පහක් ඔස්සේ පර්යේෂණය මෙහෙයවනු ලැබීය. පර්යේෂණ අරමුණු ඉටු කරගැනීම සඳහා අධ්‍යයනයක යෙදීමට උචිත ආකාරයට සම්මුඛ සාකච්ඡා, ලේඛන සමීක්ෂණ හා ප්‍රශ්නාවලි දත්ත රැස් කිරීමේ උපකරණ ලෙසින් යොදා ගනිමින්, 2012/2013 අධ්‍යයන වර්ෂයේදී උක්ත පාඨමාලාව හැදෑරූ ගුරුසිසුන් විස්සක් ද, පාඨමාලාවේ ඉගැන්වීම් කාර්යයේ යෙදුනු සියලුම කථිකාචාර්යවරුන් ද, නියැදිය ලෙස තෝරා ගනිමින් දත්ත රැස් කිරීම කරනු ලැබීය.

මිශ්‍ර ක්‍රමවේදය යටතේ, සම්මුඛ සාකච්ඡා, ලේඛන සමීක්ෂණ හා ප්‍රශ්නාවලි මඟින් ලබාගත් දත්ත තේමා විශ්ලේෂණය ඇසුරින් අධ්‍යයනය කර නිගමන රාශියකට එළඹීමට හැකිවිය. පාඨමාලාවේ අරමුණුවලට සමාන අරමුණ සහිත ගුරුශිෂ්‍යයින් බහුතරයක් ද, පාඨමාලාවේ අරමුණුවලට පරිබාහිර වූ අරමුණු සහිත ගුරුශිෂ්‍යයින් සුළුතරයක් ද, පාඨමාලාවට සහභාගි වනබව හඳූනාගත හැකිවිය. සමස්ත ගුරුශිෂ්‍ය පරපුරේම අරමුණු පාඨමාලාවේ අරමුණු සමඟ බද්ධ වන ආකාරයට පාඨමාලාව ක්‍රියාත්මක කිරීම කථිකාචාර්යවරුන් සහ ගුරුශිෂ්‍යයින් එකමුතුව සිදු කල යුතු බව අනාවරණය විය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළදී ගුරුශිෂ්‍යයාට ලබාදෙන ප්‍රායෝගික දැනුම වැඩිකිරීමෙන්, ඉහළ ඵලදායිතාවයක් ඇති කරන බව හඳූනා ගැනුණි. පාසල් පරිසරය සහ ගුරුශිෂ්‍යයාගේ ස්වභාවය, පිළිබඳ දැනුවත් බවින් යුතු කථිකාචාර්යවරුන්ව ගුරුශිෂ්‍ය අධීක්ෂණ කාර්යයේ යෙදවීම, ගුරුශිෂ්‍ය කැමැත්ත බව හෙළිවිය. ඒ අනුව පාඨමාලාව ක්‍රියාත්මක කෙරෙන ආකාරය තුළ ප්‍රබලතා මෙන්ම දුබලතා ද පවතින බව අනාවරණය වුණි. එම දුබලතා අවම කිරීමට විශ්වවිද්‍යාල කළමනාකාරිත්වය, කථිකාචාර්යවරුන් හා ගුරුශිෂ්‍යයින් සහ අධ්‍යාපන අමාත්‍යාංශය සාමූහිකව දායකත්වය ලබාදිය යුතු බවත් නිගමනය කළ හැකිවිය.

ඉහත නිගමන මත යෝජනා ඉදිරිපත් කිරීමද පර්යේෂණය තුළින් සිදුවිය. ගුරුශිෂ්‍ය අරමුණු පාඨමාලාවේ අරමුණු සමඟ බද්ධ කිරීමට කටයුතු කිරීම, ගුරුශිෂ්‍ය, කථිකාචාර්ය ආකල්ප වර්ධනයට අවශ්‍ය වැඩසටහන් සකස්කිරීම, අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලබාදීම, සාකච්ඡා මගින් ඇතිකරගත් මතවාද පිළිබඳ පොදු එකඟත්වයෙන් එළඹුනු සම්මුතීන් මත ගුරුසිසුන් දැනුවත්කිරීම, කාර්යමූල පර්යේෂණ සඳහා ගුරුසිසුන් යොමු කිරීමට කටයුතු කිරීම, ගුරුශිෂ්‍යයන් ඉගැන්වීම් පුහුණුවට යොමු කිරීමේ දී අදාළ පාසල් දැනුවත් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය හරහා සිදු කිරීම යනාදිය පර්යේෂණයේ යෝජනා සමහරකි.

## Abstract

This research was based on the identification of the experiences which related to all the parties who involved in the implementation process of the Post Graduate Diploma in Education Fulltime course. Identifying the relationship between the course objectives and the students' expectations, studying the teaching learning process of the course, identifying the implementation process of teaching practicum of the course, determining the workflow conducting of the thesis and understanding the challenges which occur during the period of course were the main objectives.

As the data collection methods, interviews, documentary survey and questionnaire were used appropriately to achieve the objectives which included twenty student teachers and all the lecturers of the 2012/2013 academic year as the sample. The data which was derived using the mix method has been further developed using the qualitative & quantitative data analysis and was able to obtain several important findings. According to the implementation process of the course there are strengths as well as weaknesses, but the senior management of the university, the ministry of education, lecturers and also student teachers have to contribute as a team to minimize the weaknesses of the course.

According to the conclusions, several recommendations have been introduced. Taking necessary actions to relate the course objectives and the expectations of student teachers, preparing programme to develop the attitudes of student teachers as well as lecturers, gaining essential human and physical resources, increasing awareness of student teachers only based on the agreements which made through the discussions, encouraging student teachers on action research, increasing the awareness of schools on teaching practicum through the Ministry of Education were the recommendations of the study.